# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.08.12 පැය 2230 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1574/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු**</u>

## 01. මාරක රිය අනතුරක් - වැල්ලව පොලිස් වසම.

2025.08.12 වන අද දින දහවල් කාලයේ වැල්ලව පොලිස් වසමේ මුත්තෙට්ටුගල හිරිපිටිය මාගර්යේ 10 කණුව ප්‍රදේශයේදී මුත්තෙට්ටුගල දෙස සිට හිරිපිටිය දෙසට ධාවනය වූ වෑන් රථයක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි පාපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පාපැදිකරු බරපතල තුවාල ලබා හිරිපිටිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 67 ක් වූ කටුකෙන්ද, මකුල්වැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය හිරිපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ වෑන් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. වැල්ලව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 02. නාඳුනන මෘත ශරීරයක් හමුවීම - කලවාන පොලිස් වසම.

2025.08.12 වන දින දහවල් කාලයේ කලවාන පොලිස් වසමේ කලවාන මතුගම මාගර්යේ කොඩිප්පිලිකන්ද ප්‍රදේශයේ ඇල මාගර්යක බෝක්කුවක් යට මළ සිරුරක් ඇති බවට කලවාන පොලිසියට ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

මරණකරුගේ අනන්‍යතාව මෙතෙක් තහවුරු වී නොමැත. මෙම මරණය සියදිවි නසා ගැනීමක්ද ඝාතනයක් යන්න පිළිබඳව වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

කලවාන පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 03. පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් සිදු කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - දිවුලපැලැස්ස පොලිස් ස්ථානය.

2025.08.12 වන දින දහවල් කාලයේ දිවුලපැලැස්ස පොලිස් වසමේ දිවුලපැලැස්ස ප්‍රදේශයේදී වුලපැලැස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු කැණීම් උපකරණ හා පූජා භාණ්ඩද සමඟ** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 44 හා 48 වයස්වල පසුවන දිවුලපැලැස්ස ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

දිවුලපැලැස්ස පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**